# 2015 වර්ෂයට කොරියානු රැකියා 5000ක්...



කොරියානු රජයේ තානාපති චැං වොන් සම් (Chang Won-Sum) මහතා ඊයේ විදේශ රැකියා අමාත්‍ය නීතීඥ තලතා අතුකෝරළ මහත්මිය විදේශ රැකියා අමාත්‍යංශයේදී හමුවූ අතර, එහිදී කොරියානු රජයෙන් මෙවර කර්මාන්ත අංශයට රැකියා අවස්ථා 4300ක උපරිමයක් හා ධීවර අංශයට තවත් රැකියා විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ලබාදීම හරහා රැකියා අවස්ථා වැඩි ප්‍රමාණයක් ලබාගැනීමට හැකිවූ බව ප්‍රකාශ කළේය.

මේ පිළිබඳව අදහස් දැක්වූ අමාත්‍යතුමිය සඳහන් කළේ, කොරියානු රජයෙන් ලාංකිකයින්ට ගැලපෙන හොඳ රැකියා අවස්ථා හිමිවී ඇති බවත්, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කොරියානු අංශයට අවශ්‍යකරන පහසුකම් ලබාදීමට නිළධාරීන්ට උපදෙස් ලබාදුන් බවත්ය. කොරියානු රැකියා ලාභීන් සිය පුහුණුවීම් සඳහා ගත කරන ප්‍රමාදය අවම කිරීමටත්, එමෙන්ම අවශ්‍ය පොලිස් වාර්තා ලබාගැනීමේදී පොලිස්පතිතුමා සමඟ සාකච්ඡා කර ඇතිවන ප්‍රමාදයන් අවම කර කඩිනම් පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බවත් සඳහන් කළාය.

මෙම අවස්ථාවට විදේශ රැකියා අමාත්‍යංශයේ ලේකම් ජී.එස්.විතානගේ, කාර්යාංශයේ සභාපති නීතීඥ නන්දපාල වික්‍රමසූරිය, අමාත්‍යංශයේ උපදේශක පත්මිණී රත්නායක හා කොරියානු මානව සම්පත් අංශයේ දේශීය අධ්‍යක්ෂක පාක් යන්ග් බම් යන මහත්ම මහත්මීන් එක්වී සිටියහ.